# ලංකා ඉතිහාසය

## 6.1.1 දඹදෙණි රාජධානිය
## ( පිළිතුරු )



පිළිතුරු.

බහුවරණ ප්‍රශ්න.

1.) 4 ( භුවනෙකබාහු ආදිපාද ) 2.) 5 ( ACF )

3.) 1 ( වීර අලකේශ්වර ) 4. ) 2 ( කව් සිළුමිණ )

5. ) 1 ( බෙලිගල පර්වතය. )

රචනා ප්‍රශ්න.

1. ) දේශපාලන වැදගත්කම.
* වන්නි ප්‍රධානියෙකු ලෙස මුලින් කටයුතු කිරීම නිසා වන්නි පාලකයන් අවනත කර ගැනීමට හැකිවීම.
* මායා රට ( දක්ඛිණ දේශය ) එක්සත් කොට දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට හැකිවීම.
* දඹදෙණිය ( ජම්බුද්‍රෝණය ) සිය පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගැනීම සහ පවුරු සම අගල් ආදියෙන් යුක්ත ආරක්ෂක මධ්‍යස්ථානයක් ලෙස ශක්තිමත් කිරීම.

ආගමික වැදගත්කම
* කොත්මලේ ප්‍රදේශයේ සගවා තිබූ දන්ත ධාතූන් වහන්සේ සහ පාත්‍රා ධාතුව බෙලිගලට වැඩමවා දළදා මැදුරක් තනවා තැන්පත් කිරීම.
* දඹදෙණිය විජයසුන්දරාරාමය හා වත්තල විජයබාහු විහාරය කරවීම.
* කැලණි විහාරයේ චෛත්‍ය හා එහි ජරාවාස වූ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම.

2. ) A දේශපාලන වැදගත්කම.

* දෙවන පරාක්‍රමබාහු රජුගේ 11 වන රාජ්‍ය වර්ෂයේ දී එනම් 1247 දී තාම්‍රලිංග දේශයෙන් පැමිණි චන්ද්‍රභානු නම් ආක්‍රමණිකයාට මුහුණ දී ඔහු පරාජය කිරීම. ( චන්ද්‍රභානු ගේ පළමු ආක්‍රමණය )
* 1255 වර්ෂයේදී ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය නම් පාණ්ඩ්‍ය අධිරාජ්‍යාගේ ආධාර ලබා ගනිමින් ප්‍රබල ම සතුරා වූ කාලිංග මාඝ පරාජයට පත් කිරීම.
* 1261 / 62 වර්ෂවල දී නැවත ආක්‍රමණයක් දියත් කළ චන්ද්‍රභානු ( චන්ද්‍රභානු ගේ දෙවන ආක්‍රමණය ) පරාජය කොට මරණයට පත් කිරීම.

B ආගමික වැදගත්කම.
* බෙලිගල සිට දඹදෙණියට දළදා වැඩම වීම සහ දළදා ප්‍රදර්ශන පැවැත්වීම.
* දිඹුලාගල මේධංකර මහ නා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ශාසන ශෝධනයක් ඇති කොට සංඝ සමාජය ක්‍රමවත් කිරීම.
* භික්ෂූන් වහන්සේලාගේ යහ පැවැත්මට අදාළ නීති රීති ඇතුළත් කර දඹදෙණි කතිකාවත සකස් කිරීම.
* රුවන්වැලි සෑය ඇතුළු වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
* මහවැලි ගඟේ දාස්තොට දී උපසම්පදා උත්සවයක් පැවැත්වීම.
* තාම්‍රලිංග දේශයෙන් ධම්මකීර්ති මා හිමියන් වැඩම කරවා උන් වහන්සේගේ අනුශාසනා පරිදි වනවාසී භික්ෂු පරම්පරාව මෙරට පිහිටුවීම.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනෙවිය. ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය- නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

* කැළණි විහාරය, බෙන්තොට විහාරය, ගලපාත විහාරය, බෙලිගල විහාරය, හා දෙවුන්දර උපුල්වන් විහාරය ප්‍රතිසංස්කරණය කිරීම.
* විවිධ ස්ථාන වල පිරිවෙන් පිහිටු වීම හා භික්ෂු අධ්‍යාපනයේ දියුණුවට කටයුතු කිරීම.
* මහ සමන් දේවාලය ඉදිකිරීම.
* වාර්ෂිකව කඨින පූජෝත්සව පැවැත්වීම හා පෙරහැර ආදිය පැවැත් වීමට අනුග්‍රහ ලබා දීම.
* මාඝ විසින් පැහැර ගන්නා ලද විහාර දේපල නැවත එම විහාර වලට ලබා දීම.

C අධ්‍යාපනික හා ශාස්ත්‍රීය වර්ධනය.

* පිරිවෙන් ඉදි කිරීම හා ඒවා ශාස්ත්‍රීය මධ්‍යස්ථාන බවට පත් කිරීම.
  උදා :- ( නන්දන පිරිවෙන, කුරුණෑගල මහේන්ද්‍ර පිරිවෙන, වාකිරිගල , පලාබද්දල, දඹදෙණිය විජේසුන්දරාරාමය, මයුරපාද පිරිවෙන, දේවපතිරාජ පිරිවෙන, )
* රජු උගත් පඬිවරයෙකු වීම සහ ග්‍රන්ථකරණයේ නියැලීම ( විසුද්ධි මග්ග සන්නය, වින විනිස සන්නය, කව් සිළුමිණ ) නිසා මෙතුමා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබීම.
* ග්‍රන්ථ කරණයට අනුග්‍රහ දැක්වීම ( පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, සිදත් සඟරාව, එළු සඳරුස් ලකුණ, උම්මග්ග ජාතකය, )ආදි සාහිත්‍ය ග්‍රන්ථ රාශියක් මෙම යුගයේ බිහි වීම.
* විදේශයෙන් ත්‍රිපිටකධාරී භික්ෂූන් ගෙන්වා පාලි සාහිත්‍යයේ උන්නතියට කටයුතු කිරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනෙවිය. ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය- නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk